## Cartoon By Shanika Somatilake




06 වන පිටෙන්

ගත්තේය. ලේ පෙරෙන මළ සිරුර හොඬෙන් ඔසවා ගත් ඇසළයා උමතුවෙන් මෙන් යලිත් වාඩිය වෙත පියවර මනින්නට විය. රුධිරයෙන් තෙත්වූ මළකඳක් හොඬෙන් ගත් හස්ති රාජයාගේ දසුන කා තුලත් ඇති කළේ බියකි. එතැන සිට සැතපුම් කාලක් පමණ ඈතින් පිහිටි වාඩිය වෙත සිරි සේනගේ මළ සිරුර ඇසළයා ගෙනගියේය.

එතැනට මළ මිනිය රැගෙන ගිය ඇසළයා දැන් දකින්නේ තමා විසින් තුවාල කරන ලද රතවාහන විනාශ කරන ලද වාඩියය. අවාසනාවකට මෙන් ඇසළයාගේ පහරට ඉලක්ක නොවූ සිය වර්ගයේම එකෙක් කිතුල් කොටයක රස බලමින් කණුවේ බැඳ සිටියේය. ඇසළයා සිරිසේනගේ මළ සිරුර පසෙකින් තබා කොල අතුවසා කණුවේ සිටිය අලියාට ඇති වීරියෙන් පහර දෙකක් දුන්නේය.

තුන්වෙනි වතාවටත් හස්ති රාජයා ඇත් ගොව්වාගේ මළ සිරුර හොඬයෙහි දවටා ගත්තේය. එහා පැත්තේ සිට සැතපුම් කාලක් පමණ ගෙනා මළසිරුර ඇසළයා යලිත් තිබුණ තැනටම ඔසවාගෙන ගියේය. සිදුවන්නට යන්නේ කුමක්දැයි අදහාගන්නට නොහැකිව මිනිස්සු බියෙන් තැතිගෙන බලා සිටියේය.

ඇසළයා මෙල්ල කරන්නට දැන් කවුරුන් හෝ වීරයෙකු පහළ විය යුතුමය. අලියාගෙ ඉදිරිපස පැත්තේ දම්වැලක් එල්ලෙමින් තිබීම වාසනාවක් විය.

තුවාන් අයියා මුස්ලිම් ජාතික අලි මන්ත්‍ර කරුවෙකි. ධෛර්‍ය උපදවාගෙන ඉදිරිපත් විය. අතේ තිබුණ දංවැල බුරුත ගහකට පටලවා ගන්නා ලද අතර කිත්තං කඹයකට ගැටය හිර කරන මන්ත්‍රය ජප කළේය. ඒ මන්ත්‍රය හරියටම ක්‍රියාත්මක වූ බව දැන ගන්නේ අලියා පාචනය ඇති වුවහොත්ය. උමතුවෙන් මෙන් මගතොට අයිති කරගෙන සිටි ඇසළයා තුවාන් ගේ ගැටයට යට වී " පාචනය කොට"පරාජය පිළිගත්තේය.

